# ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
## காணி, காணி அபிவிருத்தி அமைச்சு
## Ministry of Land and Land Development

"ගොවිජන මන්දිරය", 80/5, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල. "கொவிஜன மந்திரய", 80/5, ராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
"Govijana Mandiraya", 80/5, Rajamalwatte Avenue, Battaramulla, Sri Lanka.


| මගේ අංකය<br>எனது இல.<br>My No. | එල්ඩී/12/1/1/29 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2007.11 |
|---|---|---|---|---|---|

චක්‍රලේඛ අංකය - 2007/04

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසර පත්‍ර නිකුත් කිරීම හා දීමනා පත්‍ර නිකුත් කිරීම.</u>**

ඇතැම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ රජයේ ඉඩම්වල පදිංචිව සිටින අනවසරකරුවන් නියමානුකූල කිරීමේ දී හා ඉඩම් කච්චේරි පවත්වා සුදුස්සන් තෝරා ගැනීමේ දී ඉඩම් සංවර්ධන ආඥාපනතේ සලස්වා ඇති ක්‍රියා පරිපාටි අනුගමනය නොකර අවසර පත්‍ර නිකුත් කිරීම සිදුවන බව පෙනී ගොස් ඇත. එසේම ව්‍යාජ බලපත්‍ර සකස් කිරීම පිළිබඳ සිද්ධි ද දැනට වාර්තා වී ඇත. මේ නිසා වහාම ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළයුතු බවට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

01. ප්‍රාදේශීය ලේකම්වරයෙකු හැර වෙනත් බලයලත් නිලධාරීන් විසින් අවසර පත්‍ර අත්සන් කිරීම වහාම අත්හිටුවන්න.

02. පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් <u>ඉඩම් සංවර්ධන ආඥාපනතේ 20 "අ" වගන්තිය යටතේ</u> අවසර දෙනු ලැබූ අවස්ථාවක නිකුත් කරනු ලබන අවසර පත්‍රවල ඉහළ වම් කෙළවරේ එසේ අවසර දුන් ලිපියේ අංකය හා දිනය ද ඇතුළත් කර ඒ බවට සටහනක් යොදා එය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළයුතුය.

03. විධිමත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්ගෙන් අනුමැතියක් ලබා නොගෙන පවත්වා ඇති ඉඩම් කච්චේරි මගින් තෝරා ගත් පුද්ගලයින්ට බලපත්‍ර නිකුත් කිරීම වහාම අත්හිටුවීමට කටයුතු කළයුතුයි.

04. විධිමත් සංවර්ධන සැලැස්මක් අනුමත කරගෙන පවත්වනු ලැබූ <u>ඉඩම් කච්චේරියක දී</u> තෝරා ගනු ලැබූ පුද්ගලයන්ට නිකුත් කරන බලපත්‍ර සම්බන්ධව පහත සටහන බලපත්‍රයේ වම් ඉහළ කෙළවර තබා, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කළයුතුය. "ඉ.කො.ජ/ප.ඉ.කො.ගේ .............................. අංක .............................. දිනැති


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2888907 ෆැක්ස් / தொலைநகல் /Fax - 011-2887404

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2887410,011-2887414 ෆැක්ස් / தொலைநகல் /Fax - 011-2887404

ලිපිය මගින් අනුමත කරන ලද ඉඩම් කච්චේරිය මගින් ............................... දින ................................ දරණ අනු අංකය යටතේ මෙම අය තෝරා ගන්නා ලදි. "

05. දැනට නිකුත් කර ඇති අංකයක් නොමැති බලපත්‍ර ඇතුළුව නිකුත් කරන සියලුම බලපත්‍ර වලට නියමිත අංකයක් ලබාදීම අනිවාර්යයෙන් කළයුතු අතර, එම නිකුත් කිරීම "බෙදා දීමේ ලේඛනයේ (ඉ.කො.13)(Alianation Register)"ඇතුලත් කළයුතුය.

06. දැනට නිකුත් කර ඇති බලපත්‍ර සඳහා දීමනා පත්‍ර පිළියෙල කර එවීමේදී එම පුද්ගලයා නිත්‍යානුකූලව ඉඩම් කච්චේරියක් මගින් හෝ නිත්‍යානුකූලව දෙනු ලැබූ 20 "අ" අනුමැතියක් මත තෝරාගත් අයෙකු බවට සහතිකයක් ප්‍රාදේශීය ලේකම් විසින් එවිය යුතුය. ප්‍රාදේශීය ලේකම්ට එම සහතිකය ලබාදීම සඳහා ප්‍රමාණවත් තොරතුරු කාර්යාලයෙන් සොයාගත නොහැකි අවස්ථාවල සුදුසු පරිදි ක්ෂේත්‍ර මගින් තොරතුරු තහවුරු කර ගැනීමත් කළයුතුය.

මේ සම්බන්ධව පැහැදිලි කර ගැනීමක් ඇත්නම් කරුණාකර මා අමතන්නේ නම් මැනවි. කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

ජයලත් ර.වී.දිසානායක
ලේකම්

<u>පිටපත්</u>

01. ජනාධිපති ලේකම්
02. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
03. ඉඩම් කොමසාරිස් ජනරාල්
04. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
05. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්